8

අඟුල්මල් දමනය

ගුරුළුගෝමි
(පොළොන්නරු අවධිය)

අමාවතුර

බුදුරජාණන් වහන්සේගේ 'පුරිස දම්ම් සාරථි' ගුණය මුල් කොට ගෙන ගුරුළුගෝමි නම් පඬිවරයා **අමාවතුර** රචනා කොට ඇත. ගුරුළුගෝමි පඬිතුමන් විසූ යුගය නිශ්චිත වශයෙන් ම සඳහන් ව නැතත්, විවිධ විද්වත් මතවලට අනුව ඔහු සිටි යුගය පොළොන්නරු රාජ්‍ය කාලයට අයත් වන බව පිළිගැනේ.

මෙහි අන්තර්ගත පරිච්ඡේද ගණන දහඅටකි. ඉන් පළමු පරිච්ඡේද තුන වන දුර්දාන්ත දමනය, ස්වසන්තාන දමනය හා පරසන්තාන දමනය යන්නෙහි වස්තු නිර්දේශයේ දැක්වෙන පරිදි බෝසතාණන් වහන්සේ පෙරුම් දම් පිරූ අවස්ථා දැක්වෙන ජාතක කතාවන්ගෙන් ආරම්භ කොට බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර පිළිගැනීම දක්වා වූ කතා, ප්‍රකාශ වේ. හතරවන පරිච්ඡේදයේ එන ගෘහපති දමනයේ දී නැවතත් වස්තු නිර්දේශයක් ඉදිරිපත් කරමින් 'පුරිස දම්ම සාරථි' ගුණය විස්තර කරයි.

ඒ අනුව උපාලි ගෘහපතියාත්, කූටදත්ත බමුණාත්, අජාසත් රජුත්, අංගුලිමාලත්, සභිය පරිබ්‍රාජකයාත්, සච්චක බමුණාත්, පාථික පුත්‍ර දිගම්බර ජෛනයාත්, සච්ච බද්ධක ජටිලයාත්, බාවරික තවුසත්, ශාක්‍ය භික්ෂුවත්, නන්දෝපනන්ද නාගරාජයාත්, නාලාගිරි ඇත් රජුත්, ආලවක යක්ෂයාත්, රාහු අසුරින්ද්‍රයාත්, බක නම් බඹහුත් දමනය කළ ආකාරය අමාවතුරෙහි දැක්වේ. මෙහි එන 'නාග දමනය' නම් වූ දාහතර වන පරිච්ඡේදයේ පමණක් කොටස් දෙකක් යටතේ දමන දෙකක් දක්වයි. ඒ නාග ශබ්දයෙන් ප්‍රකාශ වන නාගරාජයකු දමනය කිරීමත්, නාග ශබ්දයෙන් ම ප්‍රකාශ වන ඇතකු දමනය කිරීමත් ය.

අමාවතුර රචනා කිරීමෙහි කතුවරයාගේ බලාපොරොත්තුව කුමක්ද යන්න "නොවියත් හුදී ජනන් සඳහා සිය බසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබේ" යන ප්‍රකාශයෙන් තහවුරු වේ. එනම් පාලි සංස්කෘත භාෂා නූගත් සාමාන්‍ය ජනයා සඳහා සිය බසින් (සිංහල භාෂාවෙන්) මෙම කෘතිය සම්පාදනය කොට ඇති බව පැහැදිලි වේ. අමාවතුර ග්‍රන්ථයෙහි භාෂාව පිළිබඳව විමසීමේ දී පැරණි සිංහල භාෂාව ද බෙහෙවින් ම උපයෝගි කර ගෙන ඇති බව පෙනේ. සිංහල කතා කලාවේ සංක්ෂිප්ත රීතිය නිරූපණය කරන කෘතිය මෙයයි.

අමාවතුර ග්‍රන්ථයෙහි හත්වැනි පරිච්ඡේදයේ ඇතුළත් වන්නේ අඟුල්මල් දමනයයි. අංගුලිමාලගේ උපතේ සිට බුදුන් සරණ යෑම දක්වා කතාව එහි අන්තර්ගත වේ.

අඟුල්මල් දමනය

අඟුල්මල් සොරහු දමූ පරිදි කිසෙ යැ යත්: කොසොල් රජහුගෙ භර්ග නම් පුරෝහිතයා පිණිසෙ මන්තාණි නම් බැමිණි ගබ් ගෙනැ රෑ පුතකු ප්‍රසව කළා. ඔහු මවු කුසින් නික්මෙන කලැ සියලු නුවර ආයුධ දිලිණ. රජුගෙ යහන්හි තුබු මඟුල්කඩුව ද සෙසු අවි දු දිලිණ. බමුණු නික්මැ නකත්තරු බලන්නේ සොරනකතින් උපන් බව් දැනැ රජු කරා ගොස් "දවස් ගිය සෙ සුව ද?" යි පිළිවිත. රජ "දවස් ගිය සෙ නොසුව යැ. රෑ මා ගෙ මඟුල් අවි දිලිණ. රජයට හො දිවියට හො අන්තරාය වෙයි යන සිතින් නිදි නො ලත්මී" කී යැ. "මහරජ, නො බව. මා ගෙ ගෙහි කුමරෙක් උපන. උහු ගෙ අනුභාවයෙන් තොප ගෙ මතු නො වෙයි, සියලු නුවර ආයුධ දිලිණැ" යි කී යැ. රජ එ කල්හි "කිමෙක් වෙ?" යි පුළුවුත්තෙන් "සොරෙක් වේ" යි කී යැ. "එක සොරෙක් වෙයි හො? බොහො සොරුන් ගෙනැ රට පහරනට නිසි සොරෙක් වෙයි හො?" යි කී යැ. "එක සොරෙක් වෙයි, මහරජ" යි කී යැ. එසෙ කියා තමා රජු සිත් ගන්නා සඳහා "උහු හැරැ-පියුව මැනැවැ හො? යි කී යැ. "එක සොරකු බැවින් කුම් කෙරෙයි! පිළිදගුව උහු යැ" යි කී යැ. ඔහු නම් තබන්නාහු "සියලු නුවර දිලියෙන අයුධයො කිසි කෙනෙක්නට හිංසා නො කළහ" යි 'අහිංසක' නම් තුබූහ.

ඔහු විය පත් කල්හි මවුපියො ශිල්ප උගන්නට තක්සලා නුවර නඟා-යවූහ. හෙ ධර්මාන්තෙවාසික වැ ශිල්ප උගන්නි. වත්සපනැ, කී කී දැයක් වහා සපයයි, මන වඩන නියායෙන් හැසිරෙයි, පෙම් වඩන නියායෙන් බෙණෙයි. සෙසු දරුවො පිටත් වූහු. ඔහු "අහිංසක මාණවකයා ආ තැන් පටන් ගෙනැ ඇපි නො පෙනෙම්හ. උහු කිසෙ බිඳුවම්හ!" බැණැ-ගන්නාහු "හැම දෙනා හට වඩා නුවණැති බැවින් 'නුවණ නැත්තෙ යැ' යි නොකිය හැක්ක. වත්සපනින් 'නොවත් සපනැ' යි නොකිය හැක්ක. ජන්ම ඇත්තෙන් 'අජන්මවතැ' යි නො ද කිය හැක්ක. කුමක් කරම්හ!" යි, "ආචාර්යයා අඹුව හා සසඟ ඇත්තෙ යැ යි බිඳැ-පියම්හ" යි බැණැ-ගෙනැ තුන් රැසක් වැ පළමු ඇතැම් කෙනෙක් ආචාර්යයා කරා එළබැ වැඳැ සිටියාහ. "කිම් ද දරුයෙනි?" කීයෙන් "මෙහි ඇසෙන දැයෙක් ඇති" යි කීහ. "කිමෙකැ හො?" යි කීයෙන් "අහිංසක මාණවකයා තොපට වරද්දයි ගත්තාම්හ" යි කීහ. ආචාර්ය උනට දැහැවැ "යටත්නි, මපුතු මා කෙරෙහි නො බිඳැ-පියටියාව" යි නෙරැ-පීයැ. 'අනෙක් වටැ අනෙක් රැසැ' ඇත්තො ආහ. අනෙක් වැට අනෙක් රැසැ ඇත්තො ආහ' යි තුන් රැසැ මැ ඇත්තො අවුදු එ සෙ මැ කියා "අප නො හදහා නම් තෙපි මැ පිරික්සා බලව" යි කීහැ.

ආචාර්ය ඔවුන් තමා සනා ඇති වැ බණින සෙ දැකැ 'ඇය හා ඔහු සසඟ ඇති සෙ යැ' යි බිඳී 'ඔහු මරමී' සිතී. 'ඉදින් ඔහු මැරුයෙම් වීම් නම්, 'දිසාපාමොක් ඇදුරු තමා කරා ශිල්ප උගන්නට ගිය දරුවන් දොස් දක්වා මරයි, කියා වටාලා ශිල්ප උගන්නට එන්නො නො වෙති. එ සෙ වන්නා හා මට ලාභ පිරිහෙයි. එ සෙ බැවින් ශිල්ප සමහරයට උපචාර යැ යි කියා මිනිස්දහසක් මරන්නට කියමි. එකාන්තයෙන් එයින් එකෙක් ඔහු මරයි" සිතා "පුතැ, මිනිස් දහසක් මැරුව මැනැවැ. එ සෙ වන්නා ශිල්පයට උපචාර කළා වේ" යි කී යැ. "ඇපි අන්නට හිංසා නොකරන කුලෙහි උපන්නම්හ. එ සෙ නොකට හැක්කැ" යි කී යැ. "ශිල්පයට උපචාර නොකරන්නා එල නො දෙයි, පුතැ," යි කී යැ. හෙ පඤ්චායුධ ගෙනැ ආචාර්යයා වැඳැ අටවියට වැද අටවියට වදනා තන්හි දු අටවිමධ්‍යයෙහි දු අටවියෙන් නික්මෙන තන්හි දු සිටැ මිනිසුන් මරයි. පිළී ඈ කිසි අයතියක් නොගන්නි. 'එකෙකැ, දෙකෙකැ' යි

ගණන් මතු කෙරෙමින් යෙයි. මෙ නුවණ ඇත ද, පණිවා කරනුවන් සිත් නොපිහිටන බැවින්, කල් යත් යත් ගණනුදු නො දත. එකෙකි ඇඟිලි කපා-ගෙනැ තබයි. තුබු තුබු තැනැ ඇඟිලි නස්සි. එ නස්නා සෙ දැකැ ඇඟිලි විදැ මාලා කොටැ ධැරී යැ. එයින් හෙ 'අංගුලිමාල' නම් යැ.

හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ. දර පලා සඳහා වල් යන්නාහු නැති. රෑ ගමට වැදැ පයින් පැහැරැ දොර ගලවා-පියා එහි හොතුවන් මරා-පියා 'එකෙකැ දෙකෙකැ' යි ගැණැගෙන-යෙයි. එ කල්හි ගම්වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්හ. නියම්ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් යොජනක් තන්හි මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ රාජාඞ්ගණයෙහි රැස් වැ "මහරජ, තා ගෙ රට අඞ්ගුලිමාල නම් සොරෙක් වි යැ" කියා කියා වලපිත්.

පිය බමුණු 'ම පිත් වන්නෙ වෙයි' සිතා, මවුබැමිණියට "අඟුල්මල් නම් සොරෙක් උපන. හෙ අනෙකෙක් නො වෙයි, තී පිත් අහිංසක කුමාර යැ. දන් රජ ඔහු ගන්නට යෙයි. කුමක් කට යුත්තෙ යැ?" යි කී යැ. "යා හිමි, ම පුතු ගෙනැ එ" යි කිව. "සොඳුර, මම් යන්නට නො නිස්සෙමි. සතර දෙනකු කෙරෙහි විස්වස් නැතිඃ සොර 'පෙරැ මා සබඳහ" යි විස්වස් නො කට යුත්තෙ යැ. තමා පළමු අතොට හුන් කොළ 'මා පෙරැ වළඳ ගත්තෙ යැ' යි විස්වස් නො කට යුත්තෙ යැ. රජ 'මා හා සබඳහ'යි විස්වස් නොකට යුත්තෙ යැ. ස්ත්‍රී 'මට වශ්‍ය යැ' යි විස්වස් නො ද කට යුත්තෙ යැ" යි කී යැ. මවුන් වනාහි ළ මෙළෙක් වෙයි. එයින් හො "මම් මැ මපුතු ගෙන එමී" නික්මුණ.

එ දවස් බුදුහු දෙව්රම්හි වෙසෙමින් අලුයම් සමාහි ලො බලන්නාහු අඟුල්මල් සොරහු දැකැ 'මා ගිය කලැ ඔහුට සෙත් වෙයි. ගම් නැති තැනැ මහ වල්හි සිටියෙ සිවුපදගයක් අසා මා කෙරෙහි පැවිජි වැ රාත් වෙයි. ඉදින් නො ගියෙම් නම් මව මරා සසරින් නො නැඟිය හැකි වෙයි. ඔහට සඞ්ග්‍රහ කළ මැනැවැ' යි පෙරවරු සුගත් මහපහුල් හැඳැ පෙරෙවැ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සඞ්ග්‍රහ කටැටි වැ දෙව්රමින් නික්මැ අධන්මඟ පිළිපන්හු. එකල්හි ගොන් රක්නාහු, වස්සන් රක්නාහු, සහන්නාහු, ගමන් යන්නාහු බුදුන් එකලා වැ බුදුරැස් නො විහිදැ වඩනුවන් දැකැ නො හැඳිනැ "මහණ, එ මඟට නො යා. එ මඟැ අඟුල්මල් නම් සොරෙකැ, දරුණැ, ලෙහෙ මුඩු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම් ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මර මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි. මහණ, තෙල මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතලිස් පනස් දෙන දු සැක ඇති වැ සන්නද්ධ වැ වග වග වැ යෙති. ඔහු දු අඟුල්මල් සොරහු අතැ නස්තී" කීහ. බුදුහු ඔවුන් තුන් යලක් කියතුදු නො බැණැ නැඟී වැඩියො.

සොර දු එ සමාහි දුබ්භොජනයෙනුදු දුක්ඛසෙය්‍යායෙනුදු උකටලි වී. ඔහු මැරැ මිනිස්හු එකක්හු උනු දහසක් දෙන යැ. හෙ වනාහි "එකකු විසින් දහස සපිරෙ"යි යන සිත් ඇති වැ 'යමක්හු පළමු දිටිම් ද, ඔහු මරා ගණන් සපුරමි. ශිල්පයට උපචාර කොටැ දැළි කප්වා නහා පිළි පෙරළා මවුපියන් දක්මි' යි අටවියට වදනා තැනට අවුදු මඟින් පහ වැ සිටියෙ, බුදුන් දැකැ විස්මිත වැ "මෙ මඟට පුරුෂයො දස දෙන දු විසි තිස් සතලිස් පනස් දෙන දු

සැක ඇති වැ සන්නද්ධ වැ වග වග වැ එති. ඔහු දු මා අතැ නස්ති. එතෙකුදු හොත් මෙ මහණ එකලා වැ මා අභිභවමින් මෙන් එයි. මෙ මහණහු මැරුව මැනැවැ' යි කඩු පලග ගෙනැ දුනු හියවුර බැඳැ බුදුන් පස් පස් ලුහුබඳවමින් යෙයි. යම් සෙ අඟුල්මල් සොර බුදුන් පියෙවි ගමනින් වඩනුවන් බැල පමණින් දිවෙනුයෙ හඹා නො ගත හෙ ද, එ වැනි අධිෂ්ඨානයක් කොළො. කි සෙ යැ යත්ඃ මහපොළොව නැගි නැඟී බස්නා රළ සෙයින් උහු ඇරැ බහ බහා සිට්වයි. හී-සනක් පමණ තැන් පියා යෙයි. ගිය කලැ බුදුහු පෙරට මහත් අඞගණයක් දක්වා තුමුහු මධ්‍ය වෙති. හෙ අන්ත්‍ය වෙයි. 'දැන් මොහු හඹා-ගන්මි' යි බැල පමණින් දිවෙයි. බුදුහු එ අඞගණයෙහි කෙළවරැ වෙති. සොර මධ්‍යයෙහි වෙයි. හෙ 'මෙ තැනැ දී ඔහු හඹා-ගන්මි' යි වෙළෙවි වැ දිවෙයි. බුදුහු එහි පෙරට වළක් හො ගොඩක් හො දක්වති. මෙ නියායෙන් ඔහු තුන් යොජනක් තැන් ගෙනැ වැඩියො.

සොර ක්ලාන්ත වි යැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි. එ කලැ අඟුල්මල් සොර විස්මිත වැ 'මම් පූර්වයෙහි දිවෙන ඇතුන් ලුහුබැඳ ගනිම් මැ යැ. අසුන් ලුහුබැඳ ගනිම් මැ යැ. රථ ලුහුබැඳැ ගනිම් මැ යැ. දිවෙන මුවන් ලුහුබැඳ ගනිම් මැ යැ. එතෙකුදු හොත් මම් මෙ මහණහු පියෙවිගමනින් යන්නහු බැල පමණින් දිවෙනුයෙම් හඹා නො ගත හෙම්' යි සිටැ, බුදුනට "සිට මහණ" යි කී යැ. බුදුහු "මම සිටියෙමි. තො ද සිට" යි වදාළො. එ සඳැ අඟුල්මල් සොර 'මෙ සැ මහණහු සබව් කියති. මෙ මහණ යනුයෙ මැ 'මම සිටියෙමි. තො ද සිට' යි යෙයි. යම් කාරණයකින් මෙ මහණ යනුයෙ 'සිටියා' නම් වෙ ද, මම් සිටියෙම් 'නො සිටියා' නම් වෙම් ද, එ කාරණය පිළිවිසැ බැලුව මැනැවැ' යි සිතා "මහණ, 'තො යන්නෙහි, 'සිටියෙමි' යි යෙහි. මා සිටියා හට 'නො සිටියාහ' යෙයි. තො කිසෙ සිටියෙහි? මම් කිසෙ නො සිටියෙමි?" පිළිවිත්.

එ සඳ බුදුහු "අඞගුලිමාලය, හිංසා සඳහා සතුන් කෙරෙ පැවැත්විය යුතු යම් දඬෙක් ඇද්ද, එ හැම කල්හි පියා ක්ෂාන්තිමෛත්‍රියැ සිටි වන බැවින් මම් 'සිටියා' නම් වෙමි. මෙතෙක් දහස් සතුන් මරන තා ක්ෂාන්තිමෛත්‍රියැ නොසිටි වන බැවින් තො 'නොසිටියා' නම් වෙහි. දැන් තො ඉරියවු විසින් සිටියෙහි ද, නිරයැ හො සිටිහි, තිරිසන් යොනියැ හො ප්‍රෙතවිෂයයෙහි හො අසුරකායයෙහි හො සිටිහි" යි වදාළො.

එ කල්හි අඟුල්මල් සොර බුදුන් ගෙ දෙශනා අසා, 'මෙ වෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නෙ නො වෙයි. මෙ මහාමායා දෙවිය පුතු සිද්ධත් මහණරජහු ගෙ ගර්ජනා යැ. මම් තියුණු නුවණ ඇති සම්මා සම්බුදුන් විසින් දක්නා ලද බන්දෙමි. බුදුහු යැ මට සඞග්‍රහ සඳහා මෙයට වැඩියහ' යි සිතා, "දෙව්මිනිසුන් විසින් පුදන ලද බුදුරජ බොහො කලක් ගිය කලැ මට වැඩ සඳහා මෙ මහ වලට වැඩි යැ. මෙ තැන් පටන්-ගෙනැ පව් නො කෙරෙමි; තොප ගෙ මියුරු කථා අසා යැ" යි තමා ගෙ පඤ්චායුධ ප්‍රපාතයෙහි බහා-පියා බුදුන් වැඳැ පැවිජ අයදි යැ. බුදුහු ඔහුට එහිභික්ෂුභාවයෙන් පැවිජි දුන්හ.

බුදුන් මොවුන් පැවිජි කරන කලැ 'කර සෙවුව මැනවැ පාසිවුරු සෙවුව මැනැවැ" යන කිස නැති මොහු පූර්වයෙහි සිල්වත්නට අටපිරිකර දුන් බව් දැනැ "එ, මහණ" යි දකුණත දික් කළහ. එ විගස ගිහිවෙස් අතුරුධන් වි යැ. මහණවෙස් පහළ වි යැ. ඍද්ධිමය පා සිවුරු ශරීරයෙහි ප්‍රතිමුක්ත වි යැ. හෙ මැ ඔහට පැවිජි වි යැ. හෙ මැ උපසපන්කම් වි යැ. එහිභික්ෂුභාවයෙන් උපසපන්නානට සඟුන් ගෙ උපසපන්කම් ඇත්තෙ නො වෙයි.

මෙසෙ බුදුහු අඟුල්මල් සොරහු දමා මහණ කොටැ පා සිවුරු ගන්වා-ගෙනැ සැරිසරමින් සැවැත් නුවර ගොස් දෙව්රම් වෙහෙරැ වැඩවෙසෙති. එ දවස් ඔවුන් මවු එ වනයට ගොස් අට ඉස්බක් පමණ තැනින් අන්තරිත වැ "පුතැ අහිංසකය, කොහි සිටියෙහි? කොයි හුන්නෙහි? කොයට ගියෙහි? පුතැ, මා හා නො බෙණෙහි නො?" යි කියමින් වැද ඇවිද නො දැක ගෙට ගියා.

එ කල්හි මහාජනයො කොසොල් රජු ගෙ ගෙවද්දොර රැස් වැ "මහරජ, තොප ගෙ රට අඟුල්මල් නම් සොරෙකැ, දරුණැ, ලෙමුඬු අත් ඇත්තෙ යැ, සතුන් කෙරෙහි කුළුණු නැත්තෙ යැ, ගම් නොගම් කෙළෙ, නියම්ගම් නොනියම්ගම් කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විද මාලා කොටැ ධරයි. ඔහු වළකා" යි කියා මහ හඬින් හැඬූහු.

රජ නොයෙක් වරැ "ඔහු ඇතැණියෙන් තිරැ කොටැ ගන්නෙ යැ" යි ඇතුන් දී යවී යැ. "අසැණියෙන් තිරැ කොටැ ගන්නෙ යැ" යි අසුන් දී යවී යැ. "රථැණියෙන් තිරැ කොටැ ගන්නෙ යැ" යි රථ දී යවී යැ. ඔවුන් ගොස් එ වටා-ගත් කල්හි ඔහු නැඟී "මම අඟුල්මල්මි" ශබ්ද කරන්නා හා ආවුධ පෙරළන්නට නිසි එකෙකුදු නැති. හෙ හැම දෙනා කොටා මරයි. ඇත්හු වල්ඇත් වෙති. අස්හු වල්අස් වෙති. රථ එහි මැ තිබී නස්සි. එ කල්හි රජ මහ ජනා ගෙ ගිගිරියෙන් "මා මැ ගිය මැනැවැ. ඉදින් සොර හට පරාජය වී නම්, ලුහුබැඳැ ගන්මි. ඉදින් මට පරාජය වී නම්, සල්හු වැ පලායෙමි" පන්සියක් අසුන් සදා-ගෙනැ සිවුරඟ සෙනඟ ගෙනැ සැවැත් නුවරින් නික්මැ සොරු කෙරෙ බිරි සිතින් නොයාටි වූයෙ ද ගරහනු බියෙන් යනුයෙ 'බුදුන් දැකැ ගිය මැනැවැ' යි දෙව්රම් වෙහෙර ගියෙ. කුමක් සිතා ගියෙ යත්: 'ගොස් බුදුන් වැඳැ එකත්පස්වැ හිඳිමි. 'කවර හෙයින් බැළ ගෙනැ නික්මුණුහි?' යි බුදුන් වහන්සේ මා පුළුවුස්නා දෑ යැ. එ කලැ මම් කියමි. බුදුහු වනාහි මට හුදු පරලොවින් මැ සඞ්ග්‍රහ කරන්නාහු නො වෙති. මෙ ලොවිනුදු සඞ්ග්‍රහ කෙරෙත් මැ යැ. ඉදින් මට ජය වෙ නම්, 'මහරජ, එක් සොරකු සඳහා තා ගිය මනා නො වෙ' යි වදාරන දෑ යැ. එ කලැ මහා ජනයො 'රජ සොරු නසන්නට යන්නෙ බුදුන් විසින් නවත්නා ලද යනු දන්ති. එ සෙ වන්නා හා මා නො ගරහති' යන සිතින් වෙහෙර ගියෙ, ගොස් බුදුන් වැඳැ එකත්පස් වැ හුන්නෙ යැ.

එකල්හි බුදුහු "කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ. හො?" යි වදළහැ. "වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති. මා ගෙ රට අඟුල්මල් නම් සොරෙකැ, උහු ගන්නට යෙමී" කී යැ. එ කලැ බුදුහු "ඉදින් මහරජ, තො අඟුල්මල්හු කෙහෙ බහා සිවුරු හැඳැ පෙරෙවැ පැවිජි වැ පණිවා ඈ පවකැමින් විරත වැ එක් වෙලෙ වළඳා බඹසරවස් රැකැ සිල්වත් වැ කලණදහම් පුරා වසන්නහු දිටිහි නම්, උහුට කුමක් කෙරෙහි? යි වදාළහැ. "වහන්සෙ, ඇප් උන් වඳම්හ. දුටු කලැ හුනස්නෙන් නැඟෙම්හ. හිඳුනා අසුන් දෙම්හ. සතර පසයෙන් උපස්ථාන කෙරෙම්හ" යි කී යැ. කියා තබා, 'බුදුහු ඔහු ගෙ උපනිඃශ්‍රය බලා උහු ඇරැ පැවිජි කළාහු වූහු නම්, යහ යැ' යි සිතා බුදුන් පිරික්සනු සඳහා "වහන්සෙ, එ දුසිල් පව්ටි හට මෙ බඳු සීලසංයමයෙක් කොහි වෙ ද!" යි කී යැ. එ සමාහි අඟුල්මල් මහතෙරහු බුදුනට නුදුරැ තන්හි වැඩහුන්නාහ. බුදුහු දකුණත නගා,"මහරජ, මෙ අඟුල්මලැ" යි වදාළහැ.

එ සඳ කොසොල් රජ බිය පත් වැ වෙවුලා ගියෙ. තුබු මහජනයො බිය පත් වැ කඩු පලග දමා-පියා එ එ දසායෙහි හී පලා නුවර වැද දොර පියා-ලා අගුළු ගෙනැ අටල්ලට නැගී බලමින් සිටියාහු "අඟුල්මල් සොර 'රජ මා කරා එ' යනු දැනැ පළමු අවුදු දෙව්රම්හි හුන්නෙ යැ, රජු ගත, ඇපි පලා ආවාමො දිවි ලදුම්හ" යි කීහු. බුදුහු රජ හට භය උපන් බව් දැනැ "නො බව, මහරජ, නොබව මහරජ මෙ දැන් කිහිඹියකු දු දිවි නො ගළවයි. මුහු කෙරෙන තට භය නැතී" වදාළො.

බුදුන් මෙසෙ වදාරත් මැ රජ හට භය සන්හින. රජ අඟුල්මල් මහතෙරුන් කරා එළඹැ "වහන්සෙ, අඟුල්මල් දැ යැ හො?" යි කී යැ. "එ සෙ යැ මහරජ" යි කී යැ. රජ 'පැවිජියනට දරුණු කැමින් ලද නම් කියනු නො යෙදෙයි. මවුපියන්ගෙ ගොත් විසින් බැවැහර කරනු මැනැවැ' යි සිතා "වහන්සෙ, තොප පියෙ කවර? මවු කවර? යි පිළිවිත. "මහරජ, මා පියෙ හර්ග නම් බ්‍රාහ්මණ යැ. මවු මන්තාණි නම් බ්‍රාහ්මණී යැ" යි කීහු. "වහන්සෙ, අප වත්හිමියො හර්ගයො මන්ත්‍රාණි පුත්‍රයො සස්නෙහි අභිරත වෙත්ව යි, මම් සතර පසයෙන් උපස්ථාන කෙරෙම්ව" යි කී යැ. කියමින් මැ බඩැ බඳ සළුව ඇරැ-ගෙනැ මහතෙරුන් පාමුලැ තිබී යැ. මහතෙරහු තමන් තෙළෙස් ධුතඟ සමාදන් වැ පහුල්සිවුරු පොරෝනෙන් "මහරජ, තුන් සිවුරු සැපිරැ ඇතී" කීහ. රජ බුදුන් කරා එළඹැ වැඳැ එකත්පස් වැ හිඳැ, "ආශ්චයර්ය යැ! වහන්සෙ, අද්භූත යැ! වහන්සෙ, යම් තාක් අදාන්ත සතුන් දමන දැ යැ. අශාන්ත සතුන් සන්හිඳුවන දැ යැ. නොපිරිනිවි සතුන් කෙලෙස් පිරිනිවනින් නිවන දැ යැ. වහන්සෙ, ඇපි දඬියෙනුදු සැතිනුදු සතුන් දමන්නට නො හැක්කම්හ. වහන්සෙ සතුන් නොදඬියෙන් මැ නොසැතින් මැ දමන දැ යැ වහන්සෙ, ඇපි යම්හ, බොහො කාර්යය ඇත්තම්හ" යි කී. "කල් දනැ, මහරජ" යි වදාළහැ. රජ බුදුන් වැඳැ පැදකුණු කොටැ ගියෙ.

මහතෙරුන් කුලගම් සිඟන්නට ගිය කලැ මිනිස්හු ඔවුන් දැකැ වෙවුලත් මැ යැ. පලත් මැ යැ. දොරපියා-ලත් මැ යැ. ඇතැම්හු අඟුල්මල් නම අසමින් පලා වලට හො වදිති. ගෙට වැද දොර පියා-ලා අගුළු හො ගන්ති. පලා නො යා හෙන්නාහු පිට් පෑ සිටුති. මහතෙරහු සරළුවක් හඹු දු කෙණෙස්සක් බතු දු නො ලැබෙති. අහරින් ක්ලාන්ත වෙති. අහර නොලබන්නාහු 'නුවර නම් සර්වසාධාරණ යැ' යි නුවරට වදිති. යම් දොරෙකින් වන්හු ද, එහි මිනිස්හු "අඟුල්මල් අය" යි කළ දහස් බිඳිමින් පලත්. එක් දවසක් අඟුල්මල් මහතෙරහු පෙරවරු පා සිවුරු ගෙනැ සැවැත් නුවර වැදැ, සපදන්සැරි වන බැවින්, ගෙපිළිවෙළින් කෙණෙසි අහර සිඟන්නාහු මූඪගර්භ වැ නො වැදිය හෙන මාගමක දැකැ කරුණායෙන් කම්පිත වූහු ඔවුන් පෙරැ එකක්හු උනු දහසක් මිනිසුන් මරන්නාට එක දවසකුදු කුළුණු කිසෙ උපන් යත්ඃ පැවිජිබලයෙන් උපන්.

එකල්හි අඟුල්මල් මහතෙරහු අහරකිස කොටැ බුදුන් කරා එළඹැ වැඳැ එකත්පස් වැ හිඳැ "වහන්සෙ, සැවැත් නුවරැ කෙණෙසි අහර සිඟනුයෙම් මූඪගර්භ මාගමක දිටිමි. ඇය විඳුනා දුක් මට නුරුස්සී" කීහ. "එසෙ බැවින් තො ඇය කරා ගොස් 'මා උපන් තැන් පටන්-ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැලවී නම් එ සසින් තිට දු ගබට දු සෙත් වෙව' යි සස් කරා" යි වදාළො. "වහන්සෙ, හෙ මට මුසවා වෙයි. මා විසින් බොහො සත්හු දැනැ මරන ලදහ" යි කීහු. "අඞ්ගුලිමාලය, හෙ තා ගිහිමිනිස්කලැ. ගිහිමිනිස්හු නම් සතුන් මරනු ආදි කෙරෙති. දැන් තට ආර්ය නම් ජාතියෙක් ඇති. එ සෙ බැවින් තො 'මා උපන් තැන් පටන්-ගෙනැ යැ' යි කියන තැනැ කුකුස් ඇති විහි නම්, 'ආර්ය ජාතියැ උපන් තැන් පටන්-ගෙනැ යැ' කියා" යි නඟා යවූහු.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

මහතෙරහු "මැනැවැ වහන්සෙ" යි එයට ගොස් "තමන් සස් කොටැ සෙත් කරන්නට ආ පරිදි කියා" යි යවූහු. මිනිස්හු වටා ජවනිකා බැඳැ මහතෙරනට ජවනිකායෙන් පිටතැ පුටුවක් තුබූහ. මහ තෙරහු ඉහි වැඩහිඳැ "මා ආර්ය ජාතීන් උපන් තැන් පටන්-ගෙනැ දැනැ සතක්හු දිවි නො ගැලවී නම් සසින් තිට දු ගබට දු සෙත් වෙව" යි සස් කළහ. එ සස්තෙපුල් හා සමග ඩබරායෙන් ගුළු දියක් සෙයින් දරු නික්මිණි. දිපිත් මවුනට සෙත් වී.

මහතෙරුන් හිඳැ සස් කළ තන්හි පිළක් කළහ. මූඪගර්භ වූ තිරිසන්ගතියැ සත්හු දු ඇරැ එහි හොවති. එ විගස මැ සුවයෙන් බර මුසිත්. යමක් දුර්බල ද, ගෙනැ එන්නට නොහැකි ද, ඇයට පිළ දෙවි දිය ඇරැ හිසැ ඔත් කලැ එ කෙණෙහි ම බර මුසී. සෙසු රොග ද සන්හිඳි. මෙ කප සිටුනා පෙළහරයි.

කිම හො බුදුහු මහතෙරුන් ලවා වෙදකම් කරවූවා වෙති හො! යත්: එසෙ නො වෙයි. කිසෙ යැ යත්: මහ තෙරුන් දැකැ මිනිස්හු බා පලති. ඔහු කෙණෙසි අහර නො ලදින් ක්ලාන්ත වැ මහණුවම් කරන්නට නො නිස්සහ. මෙ සෙ වන්නා හා "දැන් අඟුල්මල් මහතෙරහු මෙත්සිත් පිළ ලදින් සස් කොටැ මිනිස්නට සෙත් කෙරෙති" යි මිනිස්හු මහතෙරුන් නො බා එළැබියටි වෙති. එ කල්හි අහරින් ක්ලාන්ත නො වැ මහණුවම් කරන්නට නිසි වෙත්. එයින් බුදුහු ඔවුන් කෙරෙ අනුග්‍රහයෙන් සත්‍යක්‍රියා කැරැවූහු. සස් කොටැ සෙත් කරනු වෙද්දම් නො වෙ. මහතෙරුන් "මහණුවම් කෙරෙමි" යි කමටහන් ගෙනැ උන් කල්හි අටවියෙහි මිනිසුන් මැරු තැන් මැ පහළ වෙයි. "වහන්සෙ, දුගීමි. බොහො දරුබිලිඳුන් ඇත්තෙමි. මට දිවි දෙව" යි මරණ බියෙන් වලප්නා පරිදි දු, අත් පා සපන පරිදි දු, ආපාතයට එයි. ඔහු විපිළිසර ඇති වැ හුන් තැනින් නැඟී යෙති. එයින් බුදුහු ඔවුනට එ ජාතය අබ්බොහාරික කොටැ "එ සෙ වන්නා හා මෙ විදර්ශනා වඩා රාත් බව් ගන්නි" යි පැවිජි වූ තැන් මුල් කොටැ ආර්යජාතීන් සත්‍යක්‍රියා කැරැවූහු.

එකල්හි අඟුල්මල් මහතෙරහු නොපමා වැ මහණුවම් කොටැ රාත් වූහ. මහතෙරුන් කෙණෙසි අහර සිඟන්නට නුවර වන් කල්හි කපුටු බලු ආදීන් නෙරනා සඳහා වටා හීසනක් පමණ තන්හි යම් කවර දිශාභාගයෙකින් දමා-ලූ දඬු පහණ හකුරු අවුත් මහතෙරුන් මැ වෙරැ හෙයි. ඔහු මහසම් සිඳී ඇට දක්වා බුන් ඉසින් ලෙ වගුරුවමින් බුන් පා ඇති වැ හිණැ. හිරුණු සිවුරු ඇති වැ බුදුන් කරා ගියාහැ. බුදුහු ඔවුන් දැකැ "බ්‍රාහ්මණය, අධිවාසනා කරා. බ්‍රාහ්මණය, අධිවාසනා කරා. යම් කමක්හු ගෙ විපාකයෙන් සසරැ සිටියහොත් නොඑක් වා දහස් සුවහස් නිරයැ පස්හි එ කම්හු ගෙ විපාක තො මෙ අත්බැවැ විඳිහි" වදාළො.

මෙහි සත් ජවන් සිත්හි කුසල් වැ හො අකුසල් වැ හො උපන් පළමු ජවන් සිත් මෙ මැ අත්බැවැ විපාක දෙයි. මෙ අත්බැවැ විපාක දෙන්නට නොපොහොසත් වී නම්, විපාක නොදෙන බවට පැමිණෙ. සත් වන ජවන් සිතින් අනතුරු අත්බැවැ විපාක දෙයි. අනතුරු අත්බැවැ විපාක දෙන්නට නොපොහොසත් වී නම්, වටාලා විපාක නොදෙන බවට පැමිණෙ. එ දෙදෙනා අතුරෙහි පස් ජවන් සිත් අනාගතයෙහි යම් කලෙකැ අවකාශ ලද නම්, එ කලැ විපාක දෙයි. සසරැ සිටුනා තාක් කලැ විපාක නොදෙන බවට නො පැමිණෙ මෙ කර්මයන් ගෙ විභාග ධර්මප්‍රදීපිකා නම් මහාබොධිවංශ පරිකථායෙන් දන්නෙ යැ. මෙ බුද්ධධර්මයැ. මෙ බුද්ධචරිතයැ.

මෙ මහතෙරනට වූ කල අනතුරු අත්බැවැ දු අනාගතයෙහි යම් කලෙකැ දු විපාක දෙන කර්මයො රාත්මැඟින් කැඩුණහ. මෙ අත්බැවැ විපාක දෙන කර්ම වූ කල රාත් බවට පතානට ද වෙ.

එයින් එ වී. එ කල්හි අඟුල්මල් මහතෙරහු රහොගත වැ වැඩහිඳ ඵලසමවත්සුව විඳැ එයින් නැඟී, බුදුන් තම හට වහල් වූ සෙ සිතා සොම්නස් වැ උදන් අනන්නාහු-

"දණ්ඩෙනෙකෙ දමයන්ති - අඞ්කුසෙහි කසාහි ච,
අදණ්ඩෙන අසත්ථෙන - අහං දන්තොම්හි තාදිනා"

යනාදි ගාථායෙන් උදන් ඇනූහු.

මෙසෙයින් බුදුහු තමන් 'පුරිසදම්මසාරථී' වන බැවින් අඟුල්මල් සොරහු දු ආදිශබ්දයෙන් ගත් සඞ්කිච්ච නම් හෙරණපාණන් අතැවැසි පන් සියක් සොරුනුදු අතිමුත්තක නම් හෙරණපාණන් අතැවැසි පන් සියක් සොරනුදු බාණු කොණ්ඩඤ්ඤ නම් මහතෙරුන් අතැවැසි පන්සියක් සොරුනුදු කෙළදරුවන් කෙළකන්සුණු මහතෙරුන් අතැවැසි නව සියක් සොරුනුදු මෙ ඈ නොඑක් සිය නො එක් දහස් සොරුන් දමා අමාමහනිවන් පැමිණවූහු.

අඟුල්මල්දමන නම් සත් වන පරිච්ඡෙදය නිමි.

අරුත් පැහැදිලි කිරීම

රූපුතකු	-	රූප සම්පන්න පුතෙකු
පුළුවුත්තෙන්	-	විචාළෙන්
පිළිදගුව	-	පෝෂණය කරව
වත් සපන	-	වත් සම්පන්න
බෙණෙයි	-	කථා කරයි
සසඟ	-	සම්බන්ධය
උපචාර	-	සත්කාරය, පූජාව
අටවියට	-	වනයට
පණිවා	-	ප්‍රාණඝාත
හසර	-	හැසිරීම
අතුටහුන්	-	අතුරා හුන්
අධන් මග	-	දීර්ඝ මාර්ගය
දුබ්භෝජනයෙනුදු	-	නපුරු ආහාරයෙන් ද
දුක්ඛසෙය්‍යාවෙනුදු	-	දුක් සහගත නිදීම ද
එකක්හු උනු	-	එකක් අඩු
පිළි පෙරළා	-	ඇඳුම් මාරු කොට
කඩු පලඟ	-	කඩුව හා පලිහ
කර	-	දැලි පිහිය
කිස නැති	-	කාර්ය නැති
ප්‍රතිමුක්ත	-	බැඳී, පැළඳී, එතී
ඇතැණිය	-	ඇත් සේනාව
බිරි සිතින්	-	බියෙන්
නොයාටි වූයේ	-	නොයනු කැමැත්තේ

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

බැළ ගෙනෑ	-	භටයන් ගෙන
බඹසර වස්	-	බ්‍රහ්මචාරි ව වාසය
ප්‍රතිපක්‍ෂ	-	විරුද්ධ
කිහඹියෙකුදු	-	කුහුඹුවකු ද
අභිරත වෙත්වයි	-	ඇලෙත්වා
තෙළෙස් ජුතඟ	-	දහතුනක් වූ ධුතාංග
අදාන්ත	-	නොදැමුණු
දඬියෙනුදු	-	දණ්ඩෙන් ද
සැතිනුදු	-	අවියෙන්
දමන්නට	-	දමනය කරන්නට
සරළුවක් හඹුදු	-	කැඳ හැන්දක්වත්
කෙණෙස්සක් බතුදු	-	බත් හැන්දක්වත්
මූඪගර්භ	-	ගැබ් මුළා වූ/ කුසෙහි හරස් ව සිටින දරු ගැබක් සහිත
මාගමක	-	ගැහැනිය
සසින්	-	සත්‍යයෙන්
සස්කර	-	සත්‍ය ක්‍රියා කර
ඪබරායෙන්	-	දිය ගෙන යෑමට ගන්නා භාජනයකි
ගුළු	-	ගිලිහුණු
ආපාතයට	-	අභිමුඛයට
අබ්බෝහාරික	-	ඇවතට කරුණු නොවන, නොසැලකිය යුතු
හී සනක්	-	විදින හීයක් යන දුර
අධිවාසනා කරා	-	ඉවසන්න
පස් හි	-	පැසී
පතානට ද	-	පත් වූවන්ට ද
ජවන් සිත්	-	ගමන් කරන සිතිවිලි
පුළුවුස්නා	-	විචාරන, විචාරීම

අභ්‍යාස

01. අහිංසක දරුණු මිනීමරුවකු වූයේ කවර හේතු නිසා ද යි පැහැදිලි කරන්න.

02. අපරාධකරුවන්ගේ ක්‍රියාකාරීත්වය ජන ජීවිතය අඩාල කරන ආකාරය අංගුලිමාල දමනය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. අමාවතුරේ භාවිත භාෂා ශෛලිය පාඩම ඇසුරෙන් නිදසුන් සහිත ව විමසන්න.

04. අවස්ථා හා සිද්ධි නිරූපණයට අමාවතුර කතුවරයා දක් වූ දක්ෂතාව පිළිබඳ ඇගයීමක් කරන්න.